පුනරුත්ථාපන කාර්යාංශය
புனர்வாழ்வுப் பணியகம்
**BUREAU OF REHABILITATION**
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය
நீதி மற்றும் தேசிய ஒருமைப்பாடு அமைச்சு
**MINISTRY OF JUSTICE AND NATIONAL INTEGRATION**


අංක: 462/2, කඩුවෙල පාර,
ගනහේන, බත්තරමුල්ල.

இல: 462/2, கடுவெல வீதி,
கனஹேன, பத்தரமுல்ல.

**No: 462/2 , Kaduwela Road,**
**Ganahena , Battaramulla.**


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | BR/PROC/HQ/2025/038 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2025.06.02 |

මහත්මයාණෙනි,

<u>මිල කැඳවීමේ නිවේදනය සහ ටෙන්ඩර් කොන්දේසි - පිලිගත් වෙළඳ සන්නාමයක් සහිත ආයතන වෙතින් නිෂ්පාදිත පරිගණක</u> **<u>Desktop Computer Intel Core i3 ගණනින් 12ක්, Laptop Intel Core Ultra 5 ගණනින් 2ක් හා Mini Computer Intel Core i3 ගණනින් 10ක් මිලදී ගැනීම.</u>**

1. අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මෙම කාර්යාංශය වෙතින් මෙයට ඇමුණුම "අ" යටතේ දක්වා ඇති උපලේඛණය අනුව එහි සඳහන් භාණ්ඩ සැපයීම සඳහා මිලගණන් කැඳවනු ලැබේ.

2. <u>මිලගණන් කැඳවනු ලබන දිනය සහ වේලාව</u> : මෙම මිළගණන් 2025. 06 .13 දින 1030 පැයට වසනු ලැබේ. එම දින නියමිත වේලාවෙන් පසුව ඉදිරිපත් කරන මිල ගණන්පත් භාර ගනු නොලබන අතර, එදින නියමිත වේලාවට පසුව ඉදිරිපත් කරනු ලබන මිලගණන්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3. <u>මිලගණන්පත් වලංගු කාලය</u> : සියලුම මිලගණන්පත් අවම වශයෙන් **<u>ඒවා විවෘත කරන දින සිට දින 90ක් ඉදිරියට වලංගු විය යුතුය.</u>**

4. ඔබගේ මිළ ගණන්පත් පහත සඳහන් කොන්දේසි යටතේ ඉදිරිපත් කළ යුතුය.
   අ. මිල නියම කරන භාණ්ඩ ඉදිරිපත් කරනු ලබන පිරිවිතරයන්ට අනුව උසස් ප්‍රමිතියකින් යුක්ත විය යුතුවේ.
   ආ. සැපයුම් සඳහා මුදල් ගෙවීම සිදු කරනු ලබන්නේ භාණ්ඩ සැපයීමෙන් පසුව වේ.

5. <u>එකතුකල අගය මත බදු සඳහා ලියාපදිංචිය හා ආයතන ලියාපදිංචිය</u>: පවත්නා වර්ෂයට අදාලව දේශිය ආදායම් දෙපාර්තමේන්තුව වෙතින් නිකුත් කරන ලද වැට් නිෂ්කාශන ලිපිය (VAT Registration) හා ව්‍යාපාර ආයතනයක් බවට ලියාපදිංචිව ඇති ආයතන ලියාපදිංචි සහතිකය (Business Registration) ඉදිරිපත් කිරිම අනිවාර්යය වේ:

6. <u>මිල ගණන් ඉදිරිපත් කිරීම</u> : ලංසු තබන්නන් විසින් මිලගණන් ඉදිරිපත් කිරීමේදී මෙම මිල කැඳවීමේ නිවේදනයේ සඳහන් කොන්දේසි වලට එකඟ විය යුතුය. සියළුම මිලගණන්පත් ආයතනයේ නිළ මුද්‍රාව තබා අවසරලත් නිළධාරියෙකු විසින් නිසි පරිදි අත්සන් කර ඉදිරිපත් කළ යුතුය. එසේ නොවන මිලගණන්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. මිලගණන් වසනු ලබන දිනයේ එම වේලාවට ප්‍රථම මුද්‍රා තැබූ මිල ගණන්පත් **2025. 06 . 13 දින පෙ.ව 1030 ට ප්‍රථම අංක 462/2, කඩුවෙළ පාර, ගනහේන, බත්තරමුල්ල** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනවිත් භාරදිය හැක. තවද ෆැක්ස් මගින් හා විද්‍යුත් තැපැල මගින් ලැබෙන මිලගණන්පත් භාරගනු නොලැබේ.

7. <u>නියැදීන් (Sample) ඉදිරිපත් කිරීම :</u> මෙම උපකරණ වෙනුවෙන් සාම්පල (නියදීන්) ඉල්ලුම් නොකරන අතර මිල ගණන්පත් ඉදිරිපත් කරන උපකරණ වලට අදාලව හඳුනා ගත හැකි වර්ණ ඡායාරූප සමගින් භාණ්ඩයේ සියලුම කාර්මික තොරතුරු **(Technical Literature)** පාරිභෝගික අත්පොත හා වෙනත් අදාල වන ලේඛන මිලගණන්පත සමඟ අමුණා එවිය යුතුය.

8. <u>මිල ගණන්පත් විවෘත කිරීම</u> : ඉදිරිපත් කර ඇති සියලුම මිලගණන්පත් වසනු ලබන දිනය සහ වේලාව අවසානයේදී එම ස්ථානයේදීම විවෘත කරනු ලබන අතර, එම දිනයේදී මිලගණන් විවෘත කරන ස්ථානය වෙත ලංසු තබන්නාට හෝ බලයලත් එක් නියෝජිතයෙකුට පමණක් පැමිණීමට අවකාශ ඇත.

9. අප එක් එක් පරිගණක අවශ්‍යතා යටතේ Desktop Computer Intel Core i3 ගණනින් 12ක්, Laptop Intel Core Ultra 5 ගණනින් 2ක් හා Mini Computer Intel Core i3 ගණනින් 10 ක් වෙනුවෙන් ඉදිරිපත් කර ඇති පිරිවිතර පරීක්ෂා කර බලා ඒවා නිවැරදිව සම්පූර්ණ කර මිල ගණන්පත් ඉදිරිපත් කිරීම සිදු කල යුතුය. අසම්පූර්ණ පිරිවිතරයන් සමඟින් ඉදිරිපත් කරනු ලබන මිල ගණන්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10. <u>කාර්ය සාධක ඇපකරය/සුරක්ෂණය (Performance Bond/Guarantee)</u> : ඔබ ආයතනය වෙතින් ඉදිරිපත් කරනු ලබන මිල පිරිනැමුම යටතේ මිලදී ගැනීමට අපේක්ෂිත පරිගණක උපකරණ පුනරුත්ථාපන කාර්යාංශ ප්‍රසම්පාදන කමිටුව වෙතින් අනුමත වුවහොත් එහි කොන්ත්‍රාත් මුදල රු. 1,000,000.00 (එකතුකල අගය මත බදු වටිනාකම හැර) ඉක්මවා යන්නේ නම් කොන්ත්‍රාත් වටිනාකමින් 10% නොඅඩු "කොන්දේසි විරහිත හා " පළමු ඉල්ලීම මත නිරවුල් කරන (On demand, Unconditional)කාර්ය සාධන ඇපකරයක්/සුරක්ෂණයක් රජයේ පිලිගත් බැංකුවක් වෙතින් ඉදිරිපත් කිරීම අත්‍යාවශ්‍ය වේ.

ටෙන්ඩරය පිරිනැමුම පිළිබඳ සැපයුම්කරු වෙත දැනුම් දීම සිදු කර **සති 01 ක් ඇතුලත මෙම කාර්ය සාධන ඇපකරය/සුරක්ෂණය ලබා දිය යුතුය**. එම ඇපකරය **පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් නමින්** ඉදිරිපත් කළ යුතුය. සැපයුම්කරු කොන්ත්‍රාත් ගිවිසුම් අනුව නියමිත කාලසීමාව තුලදී භාණ්ඩ සැපයුම් කිරිමට අපොහොසත් වුවහොත් **කාර්ය සාධක ඇපකරය/සුරක්ෂණයේ සම්පූර්ණ මුදල් ප්‍රමාණය** පුනරුත්ථාපන කාර්යාංශය විසින් අයකර ගනු ලැබේ. කොන්ත්‍රාත් ගිවිසුම අනුව එකඟ වූ සැපයුම් කාලය තුලදී සැපයිය යුතු භාණ්ඩ වලින් කොටසක් පමණක් සැපයූ අවස්ථාවකදී සපයා නොමැති භාණ්ඩ ප්‍රමාණයට අනුරූපව කාර්ය සාධක ඇපකරයේ ප්‍රතිශතය සපයා නොමැති භාණ්ඩ වෙනුවෙන් අයකර ගැනීමට කටයුතු කරනු ඇත.

11. **ගිවිසුම් අත්සන් කිරීම :** ප්‍රසම්පාදන කමිටුව විසින් ටෙන්ඩර් ප්‍රධානය කරන ලද ලංසුකරු වෙත ටෙන්ඩර් පිරිනැමුම පිළිබඳ දැනුම් දීම තැපැලෙන්/ෆැක්ස් මඟින් හෝ ලිපිය අතින් භාරදීම ක්‍රියා කරනු ඇත. ඉන්පසු මෙම දැනුම්දීම සිදු කල දින සිට අනිවාර්යෙන්ම දින 07 ක් ඇතුලත සැපයුම්කරු විසින් පිරිනැමුම පිලිගැනීම ලිඛිතව පුනරුත්ථාපන කාර්යාංශය වෙත තහවුරු කර රු.1,000,000.00 (එකතු කල අගය මත බදු රහිත) වැඩි වටිනාකමකින් යුත් කොන්ත්‍රාත් සඳහා කාර්ය සාධක සුරක්ෂණයක් ඉහත "10" ඡේදයේ දක්වා ඇති පරිදි ඉදිරිපත් කළ යුතුය. රු. 1,000,000.00ක වටිනාකමට වැඩි කොන්ත්‍රාත්තු සඳහා පමණක් ලිඛිත ගිවිසුමක් අත්සන් කරනු ලබන අතර, පුනරුත්ථාපන කාර්යාංශය හා සැපයුම්කරු අතර කොන්ත්‍රාත්තුවේ සියලු කොන්දේසි පූර්ව අවබෝධයකින් පසු ඊට එකඟතාවයක් සහිතව සැපයුම්කරු හෝ ඔහුගේ බලය පවරනු ලබන නියෝජිතයන් විසින් ගිවිසුම අත්සන් කළ යුතුය. රු. 1,000,000.00 ට අඩු කොන්ත්‍රාත්තු සඳහා මිල කැඳවීමේ නිවේදනයේ සඳහන් ටෙන්ඩර් කොන්දේසි සහ ඇණවුමේ සඳහන් කොන්දේසි අනුව සැපයීම් කළ සිදු කල යුතුය.

12. **භාණ්ඩ සැපයීම :** කෙටි කාලයක් තුල තොගයෙන් භාණ්ඩ සැපයීම සඳහා ඉදිරිපත් කර ඇති පිරිනැමුම සඳහා ප්‍රමුඛත්වයක් හිමි වනු ඇත. තොග වශයෙන් දේශීයව සපයනු ලබන ඇණවුම් සඳහා උපරිම ලෙස කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කර **දින 14 ක් තුලදී අනිවාර්යෙන්ම සම්පූර්ණ භාණ්ඩ ප්‍රමාණයම (පුනරුත්ථාපන කාර්යාංශය විසින් සැපයුම්කරු සමඟ එකඟතාවයකට පැමිණ අමතර කාල සීමාවක් ලබා දී නොමැති අවස්ථාවලදී) සපයා අවසන් කළ යුතුය.** කොන්ත්‍රාත් ගිවිසුම අනුව භාණ්ඩ ප්‍රමාණයන් කොටස් වශයෙන් සැපයීම අනුමත කර ඇති අවස්ථාවලදී හැර එක්වරකදී සම්පූර්ණ භාණ්ඩ සැපයීමට ඇණවුම ලබා දී ඇති සැපයුම්කරුවන් නියමිත දිනට ප්‍රථම එක්වරකදී සම්පූර්ණ භාණ්ඩ ප්‍රමාණයම සපයා අවසන් කල යුතුය. යෝජිත සැපයුම් කාල සටහන අනුව භාණ්ඩ සැපයීමට අපොහොසත් වන සැපයුම්කරුවන් ප්‍රමාද වී සැපයුම් කරන ආයතනයක් ලෙස වර්ගීකරණයක් කර සලකනු ලබන අතර, **සැපයුම් කාලසීමාව දීර්ඝ කිරීම් සිදු නොකරනු ඇත.** ඉතාමත් නොවැලැක්විය හැකි කරුණු යටතේ වුවද සැපයුම් කිරීමට නියමිත දිනට භාණ්ඩ සැපයුම් නොකරන සැපයුම්කරුවන් හට වත්මන් මුදල් වර්ෂය තුලදී පමණක් **ප්‍රමාද ගාස්තු සහිතව/රහිතව සැපයුම් කාලය දීර්ඝ කිරීම හෝ නොකිරීම පිළිබඳ සම්පූර්ණ අයිතිය ප්‍රසම්පාදන කමිටු සභාපති (පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල්) සතු වන අතර, එම තීරණය අවසන් තීරණය වේ.**

13. **ප්‍රමාණ කල අලාභ** (Liquidated Damages) : සැපයුම්කරුවෙකු විසින් කොන්ත්‍රාත් ගිවිසුමේ එකඟ වූ කාලසීමාවට වඩා සැපයුම් කාලය දීර්ඝ කිරීම සඳහා ඉල්ලීමක් කරනු ලැබූ අවස්ථාවලදී සැපයුම් අවසන් කිරීමට නියමිතව තිබූ දින සිට **ප්‍රමාද වන සෑම සතියක් හෝ සතියක කොටසක් සඳහාම ප්‍රමාද වූ භාණ්ඩ වටිනාකමින් 1% ප්‍රතිශතයක් වන පරිදි උපරිමය ලෙස ප්‍රමාද වූ භාණ්ඩ වටිනාකමින් 10% ප්‍රතිශතයක් ප්‍රමාද කල අලාභ වශයෙන් සැපයුම්කරුගෙන් පුනරුත්ථාපන කාර්යාංශයට අය කර ගැනීමට හිමිකම් ඇත.**

14. **ප්‍රසම්පාදන කමිටු අයිතිය :** ඉදිරිපත් කරනු ලබන මිළගණන්පත් සම්පූර්ණ හෝ කොටස් වශයෙන් පිලිගැනීමක් සිදු කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය ප්‍රසම්පාදන කමිටුව/පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් සතුවන අතර, එම තීරණය අවසාන තීරණය වේ. සාර්ථක සැපයුම්කරුවන් වෙත නිල වශයෙන් දැනුම්දීමක් සිදු කරන අතර, තෝරා නොගත් සැපයුම්කරුවන් සබැඳිව කිසිදු දැනුම්දීමක් සිදුකරනු නොලැබේ.

**ජීඑම්ඩබ්ලිව්පී අබේසේකර**
ලුතිතන් කර්නල්
සහකාර කොමසාරිස් (ප්‍රසම්පාදන)
පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් වෙනුවට

මම/අප විසින් ඉහත සඳහන් ටෙන්ඩර් කොන්දේසි සඳහා එකඟ වන අතර මා/අප වෙත ටෙන්ඩර් ප්‍රධානය කරනු ලැබුවහොත් භාණ්ඩ නිවැරදි පිරිවිතරයට හා ප්‍රමිතීන්ට අනුව අප ආයතනය විසින් ඉදිරිපත් කරන ලද මිලගණන්පත් යටතේම දක්වා ඇති සැපයීම් කාලසීමාව හෝ ලබා දෙනු ලබන කාලසීමාව තුළදී සැපයීමට මා/අප සමාගම ක්‍රියාකරනු ලබන බවට එකඟවනු ලැබේ.

……………………………………………..
අත්සන

……………………………………………..
ඉහත සඳහන් කර ඇති අයගේ සම්පූර්ණ නම

……………………………………………..
තනතුර

……………………………………………..
ආයතනයේ නම

……………………………………………..
ආයතන නිල මුද්‍රාව

BR/PROC/HQ/2025/038 හා 2025.06. 02 දින ලිපියට ඇමුණුම "අ" වශයෙනි.

දේශීය වශයෙන් භාරදෙනු ලබන භාණ්ඩ/සේවා සඳහා මිලගණන් උපලේඛණය

| අ/අ | භාණ්ඩ විස්තරය | පිරිවිතර | අවශ්‍ය ප්‍රමාණය | වෙළඳ නාමය | වගකීම් කාලය | ඒකක මිල රු. (VAT රහිත) | මුළු මුදල රු. (VAT රහිත) |
|---|---|---|---|---|---|---|---|
| 1 | Desktop Computer - Intel Core i3 (With Monitor, Mouse, Key board & UPS) | පිරිවිතරය ඇමුණුම "ආ" ලෙස ඉදිරිපත් කර ඇත. | 12 | | | | |
| 2 | Laptop - Intel Core Ultra 5 | පිරිවිතරය ඇමුණුම "ඇ" ලෙස ඉදිරිපත් කර ඇත. | 02 | | | | |
| 3 | Mini Computer - Intel Core i3 (With Monitor, Mouse, Key board & UPS) | පිරිවිතරය ඇමුණුම "ඈ" ලෙස ඉදිරිපත් කර ඇත. | 10 | | | | |
| පිරිවිතර පත්‍රිකා පැහැදිලි ලෙස සම්පූර්ණ කර මිල ගණන් ඉදිරිපත් කිරීමට කාරුණික වන්න. | | | | | | | |
| එකතුව | | | | | | | |
| වැට් බද්ද 18% | | | | | | | |
| සම්පූර්ණ එකතුව | | | | | | | |

1. මිල වලංගු කාල සීමාව (දින 90ක් හෝ ඊට වැඩි) :…………………………………………………………………

2. භාණ්ඩ සැපයීමට ගත වන කාලය :……………………………………………………………………………
(සැ.යු: ටෙන්ඩරය අනුමත වුවහොත් මිලදී ගැනීමේ ඇණවුම නිකුත් කළ දින සිට දින 30ක් ඇතුළත භාණ්ඩ සපයා නිම කළ යුතුයි.)

3. ප්‍රවාහනය සම්බන්ධ තොරතුරු: ……………………………………………………………………………
(අංක 462/2, කඩුවෙල පාර, ගනහේන, බත්තරමුල්ල දරණ ලිපිනයෙහි ස්ථාපිත පුනරුත්ථාපන කාර්යාංශය වෙත රැගෙනවිත් භාර දීමට ක්‍රියා කළ යුතුයි.)

4. ආයතනයේ නම :……………………………………………………………………………………

5. ලිපිනය:……………………………………………………………………………………………

6. දුරකථන අංකය:…………………………………………………………………………………

7. ෆැක්ස් අංකය:……………………………………………………………………………………

8. විද්‍යුත් තැපැල් ලිපිනය:………………………………………………………………………

9. එකතු කල අගය මත බදු ලියාපදිංචි අංකය:………………………………………………………

10. ආයතනයේ නිල මුද්‍රාව :…………………………………………………………………………

11. ලංසු ඉදිරිපත් කරන්නාගේ අත්සන:……………………………………………………………

12. ලංසු ඉදිරිපත් කරන්නාගේ නම:…………………………………………………………………

13. අලෙවියෙන් පසු නොමිලේ ලබා දෙනු ලබන අනෙකුත් සේවාවන්:………………………………………

14. දිනය:...........................................................................................................................................

15. මිල ගණන්පත ලබා ගත් ආකාරය :...........................................................................................................

**සැලකිය යුතුයි**


- ➢ වට්ටම් මුදලක් ලබාදෙන්නේ නම් එම වට්ටම් මුදල අඩු කර මිල ගණන් ඉදිරිපත් කළ යුතුයි.
- ➢ විද්‍යුත් තැපැල් හා ෆැක්ස් මාර්ගයෙන් ලැබෙන මිල ගණන්පත් නොසලකා හරිනු ලැබේ.
- ➢ විමසීම :011-2883891
- ➢ මිල ගණන්පත් පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනවිත් භාර දිය හැකිය.

**අංක :462/2, කඩුවෙල පාර, ගනහේන, බත්තරමුල්ල**

**ජේඑම්ඩබලිව්පී අබේසේකර**
ලුතිතන් කර්නල්
සහකාර කොමසාරිස් (ප්‍රසම්පාදන)
පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් වෙනුවට

BR/PROC/HQ/2025/038 හා 2025.06. 02 දින ලිපියට ඇමුණුම "ආ" වශයෙනි.

## Specification of Desktop Computer



| S/N | Description | Specification | Bidders Specification |
|---|---|---|---|
| 1 | Brand | Branded | |
| 2 | Model | Branded | |
| 3 | CPU | 14th Gen - Intel Core i3-14100 Processor (4-Core, 12MB Cache, 3.6GHz to 4.7GHz) | |
| 4 | Memory | 8GB DDR 5 3200 MHz | |
| 5 | Maximum Memory | Upgradeable to Maximum of 16 GB Ram | |
| 6 | Storage | 256 GB M.2 PCIe NVMe – for windows And 1 TB HDD | |
| 7 | Form Factor | Business Desktop | |
| 8 | Base Frequency | Intel: 3.6GHz or Higher | |
| 9 | Cache | 12 MB Intel® Smart Cache or Higher | |
| 10 | Motherboard | Should be the same quoted brand (Serial number of the CPU should show in BIOS) | |
| 11 | Network Interface | Gigabit Ethernet Network Interface Card (10/100/1000) Internal Wi-Fi Card (USB Dongle is not accepted) | |
| 12 | Video Controller | Intel UHD Graphics with Shared Graphics Memory | |
| 13 | Keyboard | 128 Key Standard Keyboard to be as same brand in English | |
| 14 | Mouse | Two buttons with scroll wheel optical Mouse with Mouse Pad | |
| 15 | I/O Ports | Minimum 8 USB Ports; from that at least 2 USB Ports should USB 3.2 | |
| | | Minimum 1 HDMI Port | |
| | | VGA Port | |
| 16 | Power Supply | 250W PFC, or Better Power Supply | |
| 17 | Monitor | 19.5"LED (49.53 cm) or Above | |
| | | HDMI | |
| | | VGA | |
| 18 | Features | Intel(R) Wi-Fi 6 AX201, 2×2, 802.11ax | |
| | | Bluetooth(R) wireless card Multimedia Card Reader 3.0 SD | |
| 19 | Operating System | Windows 11 Pro Genuine | |
| 20 | UPS | 650VA | |
| 21 | Warranty | 3 Years Warranty Or More | |
| | | Manufacturer authorization letter | |
| | | Manufacturer year 2024 Or Above | |

BR/PROC/HQ/2025/038 හා 2025.06. 02 දින ලිපියට ඇමුණුම "ඇ" වශයෙනි.


## Specification of Laptop



| S/N | Description | Specification | Bidders Specification |
|---|---|---|---|
| 1 | Brand | Branded | |
| 2 | Model | Branded | |
| 3 | Operating System | Windows 11 Pro Genuine | |
| 4 | Processor | Intel® Core™ Ultra 5 Processor 125H 1.2 GHz (18MB Cache, up to 4.5 | |
| | | GHz, 14 cores, 18 Threads); Intel® AI Boost NPU | |
| 5 | Graphics | Intel® Arc™ Graphics | |
| 6 | Display | 14.0-inch, FHD (1920 x 1200) OLED | |
| 7 | Memory | 16GB LPDDR5X on board | |
| 8 | Storage | 1TB M.2 NVMe™ PCIe® 4.0 SSD | |
| 9 | Camera | FHD camera with IR function to support Windows Hello | |
| | | With privacy shutter | |
| 10 | Audio | Smart Amp Technology | |
| | | Built-in speaker | |
| | | Built-in array microphone | |
| | | harman/ kardon (Premium) | |
| 11 | Network and Communication | Wi-Fi 6E(802.11ax) (Dual band) 2*2 + Bluetooth® 5.3 Wireless Card | |
| | | (*Bluetooth® version may change with OS version different.) | |
| 12 | Battery | 75WHrs, 2S2P, 4-cell Li-ion | |
| 13 | Weight | 1.22 kg (2.69 lbs) | |
| 14 | Warranty | 3 Years Warranty Or More | |
| | | Manufacturer authorization letter | |
| | | Manufacturer year 2024 Or Above | |
| | | Backpack | |

BR/PROC/HQ/2025/038 හා 2025.06. 02 දින ලිපියට ඇමුණුම "ඇ" වශයෙනි.

# Specification of Mini Computer



| S/N | Description | Specification | Bidders Specification |
|---|---|---|---|
| 1 | Brand | Branded | |
| 2 | Model | Branded | |
| 3 | Processor | Intel® Core i3 10th Gen 1005G1 1.2GHz | |
| 4 | Chipset | Intel® SOC, TDP 15W | |
| 5 | Graphics | Integrated Intel® UHD graphics | |
| 6 | Memory | 2*SODIMM 8GB | |
| 7 | Storage | 1*M.2 2280 256GB | |
| | | 1*2.5" Hard disk SATA3.0 - 1TB | |
| 8 | Expansion | 1*MPCIE support Wi-Fi/Bluetooth | |
| | | 1*MPCIE support 4G LTE (SIM card interface) | |
| 9 | BIOS | AMI UEFI BIOS | |
| 10 | OS | Windows 11 Pro Genuine | |
| 11 | Audio | 1*Microphone 3.5mm jack+1*Speaker jack | |
| 12 | RJ45 | 1*RJ45 RTL8111 | |
| | | 10/100/1000Mbps GbE interface | |
| 13 | USB | 4*USB2.0 (Black color) | |
| | | 2*USB3.0 (Blue color) | |
| 14 | Display | 1*Standard VGA interface, support resolution 1920*1080p | |
| | | 1*HDMI 1.4 interface, support resolution 1920*1080p | |
| 15 | Monitor | 18.5 inch LED<br>HDMI / VGA | |
| 16 | Warranty | 3 Years Warranty Or More | |
| | | Manufacturer authorization letter | |
| | | Manufacturer year 2024 Or Above | |
| 17 | Power management | 100v -240v Auto Adoptive | |
| 18 | Keyboard | 128 Key Standard Keyboard to be as same brand in English | |
| 19 | Mouse | Two buttons with scroll wheel optical Mouse with Mouse pad | |
| 20 | UPS | 650VA | |